## එක්සත් ජනපද දිසා අධිකරණය කොලොම්බියා දිස්ත්‍රික්කය

ගොනුකළේ
2011-01-28

එක්සත් ජනපද
කොලොම්බියා
දිස්ත්‍රික්කය සඳහා වූ
දිස්ත්‍රික් හා ශුන්‍ය
අධිකරණයේ ලිපිකරු

පැමිණිලිකරුවන්
වෛද්‍ය කාසිපිල්ලෙ මනෝහරන්
ලන්ඩන් නුවර,
එක්සත් රාජධානිය.

කලෛසෙල්වි ලාවාන්
1247 SW 149 පටුමග,
සන්රයිස්, FL, 33326,
ඇමරිකා එක්සත් ජනපද

සහ

ජෙයකුමාර් අයියදුරෛ
41, රොබින්ස් මාවත දකුණ,
මිල්ස්ටෝන්, NJ 08510.

එරෙහිව

වගඋත්තර කරුඃ
පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ
"අරලියගහ මන්දිරය"
කොළඹ,
ශ්‍රී ලංකා.

නඩුව : 1:11-cv- 00235
පවරන ලද්දේඃ කොලර්- කොටෙලි, කොලීන්
පැවරූ දිනයඃ 2011-01-28
විස්තරයඃ P1/ සාපරාධී වරද

සිවිල් නඩු අංක ________

### පැමිණිල්ල

1991 ප්‍රකාශිත L. 102-256,106 Stat. 73 (92-03-12) ("TVPA"), වද හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත යටතේ, පෞද්ගලික හා නිල තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ ජනාධිපති වන පර්සි මහේන්ද්‍ර රාජපක්ෂ යන වග උත්තරකරුට එරෙහිව කාසිපිල්ලෙ මනෝහරන්, කලෛයි සෙල්වී ලාවාන් සහ ජෙයකුමාර් අයියදුරෛ යන පැමිණිලිකරුවන් විසින් පහත අත්සන් කරන ලද තමන්ගේ නීතිඥයා මගින් මෙම පැමිණිල්ල ගොනු කරනු ලබති. පැමිණිලිකරුවෝ මෙලෙස චෝදනා කරති.

## අධිකරණ බලප්‍රදේශ වස්තු විෂය

**1.** පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම් වද හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත (TVPA) යටතේ පැණ නගින බැවින් 28 U.S.C 1331 යටතේ, අධිකරණ බල ප්‍රදේශයේ වස්තු විෂය මෙම අධිකරණයට හිමිවේ.

**පෞද්ගලික අධිකරණ බල ප්‍රදේශය හා ස්ථානය**

## පෞද්ගලික අධිකරණ බලප්‍රදේශය සහ ස්ථානය

**2.** මෙම ඉල්ලීම් කොලොම්බියා දිස්ත්‍රික්කය තුළ, සිවිල් වරදක් හෝ නොසලකා හැරීම, මත පැණ නගින බැවින් වග උත්තකරු මත, මෙම අධිකරණයට, පෞද්ගලික අධිකරණ බලය හිමිවේ. D.C.Code Ann. Sec. 13-423 (a) (3) (1981). ජාත්‍යන්තර නීතිය යටතේ වද හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත (TVPA) උල්ලංඝනය, විශ්ව සහ සිවිල් පෞද්ගලික වැරදි බවට පත්වේ. 28 U.S.C § 1391(e) යටතේ ස්ථානය නිශ්චිතය.

**පාර්ශවකරුවෝ**

3. පැමිණිලිකරු වෛද්‍ය කාසිපිල්ලෙ මනෝහරන් , ("වෛද්‍ය මනෝහරන්") අදාළ නීතිය අනුව, මරණයට පත් සිය පුතු රගිහර් මනෝහරන්ගේ නිත්‍යානුකූල නියෝජිතයා වේ. එම පස් දෙනාගෙන් එක් අයෙක් වූ විසි හැවිරිදි සිය පුතු ශ්‍රී කෝනේෂ්වර හින්දු විද්‍යාලයේ උපාධිදරයෙකි. මෙම අයට, වගඋත්තකරුගේ විධාන වගකීම හා පාලනය යටතේ පවතින ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව විසින් අධිකරණමය ක්‍රියාදාමයකින් පරිබාහිරව පහර දී මරා දමන ලදි. විදේශ නීතිය නොසලකා හරිමින් 2006-01-02 දින පස්වරු 7.30 - 8.30 අතර ආසන්න කාලය තුළ දී ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලයේදී, අධිකරණ ක්‍රියාදාමයකින් පරිබාහිරව මෙම ඝාතන පහ සිදු කර ඇත. පැමිණිලිකරු පියා සහ ඔහුගේ පුත්‍රයා ශ්‍රී ලංකාවේ සුළු ජන වර්ගයක් වන ශ්‍රී ලංකා දමිළයෝය. වෛද්‍ය මානෝහරන් එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර පදිංචිකරුවෙකි.

4. පැමිණිලිකාරිය වන කලෛසෙල්වි ලාවාන්, අදාළ නීතිය යටතේ, මියගිය ඇගේ මුල් ස්වාමිපුරුෂයා වූ ප්‍රිමස් ආනන්ද රාජාගේ නිත්‍යානුකූල නියෝජිතවරිය වේ. ඔහු ශ්‍රී ලංකාවේ පැවති වාර්ගික සිවිල් යුද්ධය හේතුවෙන් මුතූර් ප්‍රදේශය තුළ අවතැන් වූ හා පීඩා විඳි ද්‍රවිඩ සියළු ජනයා වෙනුවෙන් ආහාර සැපයීමේ හා ප්‍රදේශය නැවත ගොඩනැගීමේ කාර්යයන්ට සහය දැක්වූ ACF නමින් හැඳින්වෙන, එනම් සාගින්නට එරෙහි ක්‍රියාකාරීත්ව සඳහා ක්‍රියා කළ ආයතනයේ සේවය කළ අයෙකි. එම ආයතනය යටතේ සේවය කළ 17 දෙනා 2006-07-04 වන දින නීතිමය ක්‍රියාදාමයකින් පරිබාහිරව මරාදමන ලදි. එය කරන ලද්දේ වගඋත්තරකරුගේ විධාන වගකීම සහිත ලංකා යුධ හමුදාව හෝ නිත්‍යානුකූල නොවන හමුදාවන් මගිනි. ශ්‍රී ලංකාවේ වෙසෙන ලාවාන්ගේ ඥාතිහූ දැනට වගඋත්තරකරුගේ ක්‍රියාවන් නිසා සැකෙන් හා බියෙන් තැනින් තැන යමින් සිටිති. පැමිණිලිකාරිය වන කලෛසෙල්වි ලාවාන් දැනට 1247 SW 149 Lane, Sunrise, FL 33326, හි පදංචිව සිටින්නිය.

5. පැමිණිලිකරු ජෙයකුමාර් අයියදුරෙ යන අය, ඔහුගේ නැන්දණිය වන පරමේෂ්වරී තේවරාජා, ඇගේ දියණිය විජයමාලා තේවරාජා, ඇගේ දියණියගේ ස්වාමි පුරුෂයා වන

තවරාජා තේවරාජා සහ ඇගේ මිණිබිරිය වන කේතිකා තේවරාජා, (මින් ඉදිරියේදී "තේවරාජලා" යනුවෙන් හඳුන්වනු ලැබේ) යන අය නිත්‍යානුකූලව නියෝජනය කරයි. මෙම සියළු අවස්ථාවලදී "තේවරාජලා" රජයේ ආරක්ෂක හමුදා හා වෙනත් හමුදා සමඟ සබඳකමක් නොපැවැත්වූ අය බව පැමිණිල්ලේ සඳහන්වේ. මේ අතර 2009 මැයි 14 වන දින හෝ ඊට ආසන්න දිනෙක ඔවුන් වගඋත්තරකරුගේ විධානය හා පාලනය මත පවතින ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා මගින් මරාදැමූහ. එය සිදුකරන ලද්දේ පැහැදිලිවම, යුධ මුක්ත කලාපය තුළදීය. පැමිණිලිකාර අයියදුරෛ දැනට 41 Robbins Rd. South, Millstone, NJ 08510 හි වාසය කරයි.

6. වගඋත්තරකරු වන පර්සි මහේන්ද්‍ර ("මහින්ද") රාජපක්ෂ ශ්‍රී ලංකාවේ ජනාධිපතිය. ශ්‍රී ලංකා ජනගහනයෙන් 77% වන සිංහල බෞද්ධ ප්‍රජාවට ඔහු අයත් වේ. ඔහු 2005 නොවැම්බර් මාසේ ජනාධිපති ලෙස පළමුවරට තේරී පත් වූ අතර, මේ පැමිණිල්ලට අදාල සියළු කාලාසීමා තුළ ඔහු එම තනතුරෙහි සිට ඇත. වගඋත්තරකරු ශ්‍රී ලංකාව තුළ සෑම කරුණක් සඳහාම අසීමිත බල තල දරයි. පැමිණිල්ලට අදාල කාලය තුල ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා හෝ ආරක්ෂක අංශ, වගඋත්තරකරුගේ අදහස් දැක්වීමක්, පෙළඹවීමක් හෝ බලය පැවරීමක් නොමැති කිසිදු පියවරක් ගෙන නැත. වගඋත්තරකාර රාජපක්ෂ විසින් පෞද්ගලිකව හා ඔහුගේ සහෝදරයා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ හරහා සන්නද්ධ හා ආරක්ෂක හමුදාවන්ට අණ දීම සිදු කර ඇත. වගඋත්තරකරු නීතියට පටහැනි මෙම ඝාතන පිලිබඳ දැන සිටියා හෝ දැනුවත් වී සිටිබව නිසැකය. එසේම නීතියට අදාළ නොවන එම ඝාතන සිදු කළ අයවලුන් නීතිය ඉදිරියට ගෙන ඒම ප්‍රතික්ෂේප කර ඇත. වගඋත්තරකරුගේ ග්‍රහණයට හසු වී ඇති ශ්‍රී ලංකා අධිකරණය සමඟ දේශපාලන වශයෙන් යම් සම්මුතියකට පැමිණ ඇත. ඒ අනුව මෙම පැමිණිලිකරුවන් සාධාරණ විනිශ්චියක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ අදාළ අංශ වෙත පැමිණිලි කිරීම එල රහිත බව පැහැදිලිය.

**කරුණු පිළිබඳ ප්‍රකාශනය**

7. ශ්‍රී ලංකා ද්‍රවිඩ ජනයාගේ වාර්ගික ප්‍රශ්න පිළිබඳව සිංහල බෞද්ධ කොටස් වල ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකාව නිදහස ලැබූ 1948 වර්ෂයේ සිටම පවතී. වගඋත්තරකරුගේ හැසිරීම් රටාව, ජාත්‍යන්තරය පිලිගත් මානුෂික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම, ඒ හා බැඳුණු යුධ අපරාධ, ස්ත්‍රී දූෂණ, වධ බන්ධන, අමානුෂික හා පහත් අන්දමින් සලකා දඩුවම්දීම, චෝදනාවලින් තොරව රඳවා තබා ගැනීම, සහ නිදහස පෞද්ගලික ආරක්ෂාව හා ජීවිතය පිළිබඳ තොරතුරු සැඟවීම යන වගඋත්තරකරුගේ රාජ්‍ය අපරාධවල මූලික ඉලක්කය වී ඇත්තේ ශ්‍රී ලංකා ද්‍රවිඩ ජනතාවය. වගඋත්තරකරු විසින් ජාත්‍යන්තරව පිළිගත් මානුෂික අයිතිවාසිකම් පිළිබඳව ඊට අදාළ ජාත්‍යන්තර ආයතන විසින් සිදු කළ හැකි පරීක්ෂණද වලක්වා ඇත. එම වැලැක්වීම, සාගින්නට එරෙහි ක්‍රියාකාරීත්වය, රතුකුරුස සංවිධානයේ ජාත්‍යන්තර කමිටුව, ජාත්‍යන්තර ක්ෂමා ආයතනය, ජාත්‍යන්තර ජූරි කොමිසම සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අවසර ලත් කණ්ඩාම්, පුද්ගලයන්ද, එම ආයතන වේ. වගඋත්තරකරු ජනාධිපති ධූරයට පත් වූ පසු ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ ජාතිකයන් හා මානුෂික ආධාර සපයන ආයතන වලට සහය දුන් සිවිල් ද්‍රවිඩ ජනතාව නිත්‍යානුකූල නොවන අන්දමින් ඝාතනය කිරීම පිළිබඳව මෙතෙක් කිසිදු පරීක්ෂණයක් හෝ නඩු පැවරීමක් කර නැත.

8. පහත සඳහන් වන්නේ වගඋත්තරකරුගේ අනුමැතිය මත ජාත්‍යන්තර නීතිය උල්ලංඝනයන්ගේ සිදුවීම් වල අනුපිළිවෙල දක්වන පරිපූර්ණ ලේඛනයක් සහ ප්‍රසිද්ධ ප්‍රකාශනයන්ය. විශේෂ කොට අපරාධ, ඔහුගේ අවධානයට යොමු කෙරේ.

9. 2005 දෙසැම්බර් 24 දින හෝ ඊට ආසන්න දිනෙක, අළුයම 1.20ට පමණ මඩකලපු දිස්ත්‍රික් දෙමළ ජාතික සන්ධානයේ (TNA) පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරරාජසිංගම් මහතා ශ්‍රී ලංකා පොලීසිය, රජයේ හමුදා හෝ රජයේ අනුග්‍රහය සහිත අතුරු හමුදා විසින් මඩකලපුව නගරයේ සාන්ත මරියා දේවස්ථානයේදී ඝාතනය කරන ලදි.

10. මන්නාරම් දිස්ත්‍රික්කයේ වන්කාලෙ තෝමස්පුර වෝඩ් අංක 10 ප්‍රදේශයේදී 2006 ජනවාරි 09 හෝ ආසන්න දිනෙක ශ්‍රී ලංකා රජයේ හමුදා හෝ රජයේ අනුග්‍රහය ලබන අතුරු හමුදා විසින් තියුණු ආයුධ යොදා ගනිමින් හත් හැවිරිදි සහ නව හැවිරිදි දරුවන් දෙදෙනෙක්ද ඇතුළු එකම පවුලේ සිවු දෙනෙක් ඝාතනය කරන ලදි.

11. 2006 අගෝස්තු 10 හෝ ඊට ආසන්න දිනෙක පෙරවරු 7.30ට පමණ මුලතිවු දිස්ත්‍රික්කයේ වල්ලිපුරම්හි සෙන්චෝලෙ සංකීර්ණයට ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ගුවනින් බෝම්බ හෙලීමෙන් ද්‍රවිඩ ගැහැණු ළමුන් 57 දෙනෙක් ඝාතනය කරන ලදි.

12. 2006 නොවැම්බර් 10 හෝ ඊට ආසන්න දිනෙක පෙරවරු 8.30ට පමණ යතුරුපැදිවලින් පැමිණි ශ්‍රී ලංකා පොලීසිය, යුධ හමුදාව, හෝ රජයේ අනුග්‍රහය ලත් අතුරු හමුදා විසින් යාපන දිස්ත්‍රික් ද්‍රවිඩ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් මහතා කොළඹ දිස්ත්‍රික්කයේ නාරාහේන්පිට මැණිං ටවුන්හී ඒ මහතාගේ නිවස අසලදී වෙඩිතබා ඝාතය කරන ලදි.

13. 2007 මැයි 13 හෝ ඊට ආසන්න දිනකදී ශ්‍රී ලංකා යුධ හමුදාව, හෝ රජයේ අනුග්‍රහය ලත් අතුරු හමුදා විසින් යාපන අර්ධද්වීපයේ මණ්ඩතීවු හි අලෙපිට්ටි ප්‍රදේශයේදී සිව් හැවිරිදි දරුවෙක් හා සිව්මස් බිළිදෙක් ඇතුළු එකම පවුලේ හතර දෙනෙකු ඝාතනය කරන ලදි.

14. 2008 සැප්තැම්බර් 07 හෝ ඊට ආසන්න දිනකදී ශ්‍රී ලංකා යුධ හමුදාව, හෝ රජයේ අනුග්‍රහය ලත් අතුරු හමුදා විසින් යාපනය දිස්ත්‍රික්කයේ කරවෙට්ටි, මණ්ඩන් හිදී රාසයියා ලක්ෂහන් නැමැත්තා පැහැරගෙන ගොස් දෑත් දෙපා බැඳ වද හිංසාවන්ට භාජනය කර ගෙල සිඳ මරා දමන ලදි.

15. 2007 ඔක්තෝම්බර් 03 හෝ ඊට ආසන්න දිනකදී ශ්‍රී ලංකා යුධ හමුදාව, හෝ රජයේ අනුග්‍රහය ලත් අතුරු හමුදා විසින් වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා පොලිස් කොට්ඨාශයේ වෛයාරවප්පුලියන්කුලම් හි පස් වන හරස් වීදියෙහිදී කන්දයියා ක්‍රිස්ටි රාජා නැමැත්තා පැහැරගෙන ගොස් වද හිංසා පමුණුවා මරා දමන ලදි.

16. 2008 දෙසැම්බර් 13 හෝ ඊට ආසන්න දිනකදී පෙරවරු 9.30ට පමණ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වට්ටකච්චි හි හඩ්සන් පාරේ පිහිටි ටක්රප් පිල්ලෙයාර් කෝවිල අසල අවතැන්වූවන්ගේ කඳවුරක් තුළ දී හෝ ඊට ආසන්නයේ සංක්‍රමණික ද්‍රවිඩ ජෙයරූබන් අජන්තන් නම් වූ පස් මස් හැවිරිදි බිළිදා ශ්‍රී ලංකා හමුදාවන් විසින් එල්ල කරන ලද ෂෙල් ප්‍රහාරයක් විසින් ගෙල සිදී ඝාතනයට ලක් විය.

17. 2009 ජනවාරි 17 හෝ ඊට ආසන්න දිනකදී ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ විශ්ව මඩු පාරේ පිරමන්තනා හිදී හිංදු හා ක්‍රිස්තියානි සිවිල් ද්‍රවිඩ වැසියන් තිදෙනෙකු වෙඩි තබා ඝාතනය කරන ලදි.

18. 2009 පෙබරවාරි 05 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාව හෝ රජයේ අනුග්‍රහය ලත් අතුරු හමුදා

විසින් මුලතිවු හී පිහිටි වගඋත්තරකරු විසින් "ආරක්ෂිත කලාපයක්" ලෙස නම් කරන ලද ස්ථානයකදී හින්දු හා ක්‍රිස්තියානි උතුරු නැගෙනහිර ද්‍රවිඩ පුද්ගලයන් අවම වශයෙන් 16 දෙනෙකු වෙඩි තබා ඝාතනය කරන ලදි.

19. 2009 පෙබරවාරි 07 හෝ ඊට ආසන්න දිනෙක ශ්‍රී ලංකා යුධ හමුදාව, හෝ රජයේ අනුග්‍රහය ලත් අතුරු හමුදා විසින් කොපාහී ඉරුපාලෙ හි පිහිටි සිය නිවසේදී හින්දු පූජකයෙකුගේ 94 හැවිරිදි බිරිඳ ගෙල මිරිකා මරා දමන ලදි.

20. 2009 පෙබරවාරි 12 වන දින පෙරවරු 11.30ට පමණ යාපනේ දිස්ත්‍රික්කයේ තිරුනෙල්වේලි හන්දියේ අසදිය පාදම් වීදිය අසළදී ශ්‍රී ලංකාවේ හමුදාව විසින් ශ්‍රී ලංකා ද්‍රවිඩ හින්දු ක්‍රිස්තියානී ලබ්ධිකයන් දෙදෙනෙක් ඝාතනය කරන ලදි.

21. ශ්‍රී ලංකාවේ හිටපු එක්සත් ජනපද තානාපතිවරු කිහිපදෙනෙකු විසින් මෙසේ ලියා ඇත. "මෙම සිද්ධීන් රාජ්‍ය අංශය මගින් සිදු නොකරන ලද අතර රජය අපකීර්තියට පත් කිරීමේ චේතනාවෙන් වෙනත් කණ්ඩායම් මගින් සිදු කර ඇති බව සමහරු ප්‍රකාශ කරති. එම තර්ක අපට පිලිගත හැකි නොවේ". Ambassador A. Peter Burleigh, Ambassador Shaun Donnelly, Ambassador Ashley Wills, Ambassador jeffrey Lunstead "ජනාධිපති මහින්ද රාජපක්ෂට යැවූ ලිපියෙන්". 2009 ජනවාරි 19. http://omiusajpic.org/files/2009/02/lunsteadtestimony090224p1.pdf, හි සඳහන් වේ. අවසන්වරට පිවිසුනේ 2011 ජනවාරි 26.

22. 2009 මාර්තු 13 වන දින හෝ ඊට ආසන්න දිනක එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන්, රජය මගින් නම් කළ ආරක්ෂිත ප්‍රදේශයන් තුළ පිරිහෙමින් පවතින තත්ත්වයන් හා ජීවිත අහිමිවීම් වැඩිවීම පිළිබඳව දැඩි කනස්සල්ලක් දක්වන බව වගඋත්තරකරුට දුරකතනය මගින් දන්වන ලදි. BBC ප්‍රවෘත්ති "එක්සත් ජාතීන් ශ්‍රී ලංකාවේ යුධ අපරාධ ගැන බිය පල කරයි" 2009 මාර්තු 13. : http://news.bbc.co.uk/2/hi/south_asia/7942051.stm, හි සඳහන් වේ. අවසන් වරට පිවිසුනේ 2011 ජනවාරි 26.

23. ශ්‍රී ලංකාවේ පදවි දරණ ඇමරිකා තානාපතිට අනුව "ශ්‍රී ලංකා යුධ වීරයන්ට නඩු පැවරීමට උත්සහ කරන ඕනෑම ජාත්‍යන්තර බලවේගයකට හෝ කණ්ඩායමකට තමන් පුද්ගලිකව, ඒ වෙනුවෙන් පෙනී සිටින බවට දුන් පොරොන්දුව හැර ජනාධිපතිවරණයේදී "වගකිව යුතු බව" අවධානයට ලක් නොවුන කාරණයකි. "වගකිව යුතු බව" කෙරෙහි දක්වන උදාසීනත්වය ගැන පුදුම නොවන අතර ඒ ගැන කණගාටු වෙමි. රාජ්‍ය හෝ ආණ්ඩුව බලයේ සිටින කාලය තුළ තමන්ගේ හමුදා හෝ උසස් නිළධාරීන්ගේ යුධ අපරාධ සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණ පවත්වන රාජ්‍යයක් පිළිබඳ උදාහරණ නැත. සිදු කළා යැයි කියන බොහෝ අපරාධ වලට, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් , හමුදානායකත්වය ඇතුළු ජනාධිපති රාජපක්ෂ ඔහුගේ සොහොයුරු සහ විපක්ෂ අපේක්ෂක ජෙනරාල් ෆොන්සේකා වගකිව යුතු බව වීම ශ්‍රී ලංකාව තුළ මෙය තවත් වඩා සංකීර්ණ වේ." තානාපති Patricia A.Butenis, "Sri Lanka war crimes accountability: January 15 2010 http://www.guardian.co.uk/world/us-embassy-cables-documents/243811, හි සඳහන් වේ. අවසන් වරට පිවිසුණේ 2011 ජනවාරි 26.

**ත්‍රිකුණාමලයේ පස්දෙනා ("Trinco five")**

24. වගඋත්තරකරු රාජපක්ෂගේ විධාන වගකීම යටතේ පවතින ශ්‍රී ලංකා යුධ හමුදාව (ශ්‍රී.ලං.යු.හ) නාවික හමුදාව (ශ්‍රී.ලං.නා.හ) පොලීසිය හෝ විශේෂ කාර්ය බලකාය (වි.කා.බ) යන්හී සාමාජිකයන් 2006 ජනවාරි පස් වන දින, රගිහර් මනෝහරන් ඇතුළු වාර්ගික සිවිල් දෙමළ සිසුන් පස් දෙනෙකු, විදේශ නීතිය නොසලකා හරිමින්, පහර දී නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව ඝාතනය කරන ලදි. මෙයට ලක් වූ සිසුන් ශ්‍රී ලංකා රජයට විරුද්ධ ,විරුද්ධව සටන් කළ හෝ යුද පිටියේ සිටි අය නොවෙති. නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද මෙම ඝාතන පැහැදිළිව, ස්ථාපිත යුධ නීති උල්ලංඝනය කර ඇත. මේවා, වගඋත්තරකරු, විශේෂයෙන් දෙමළ ජනතාව සම්පූර්ණයෙන් හෝ සැලකිය යුතු කොටසක්, විශේෂයෙන් ඔවුන්ගේ ජනවාර්ගික බව හෝ ලබ්දිය නිසා විනාශ කිරීමට කලින් සැලසුම් කළ ක්‍රමාණුකූල ප්‍රයත්නයක කොටසකි.

25. රගිහර් මනෝහරන්, ඔහුගේ, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව මරණය සිදුවූ කාලයේදී ඔහු කිසිදා, ශ්‍රී ලංකා ආණ්ඩුව හා දමිළ විමුක්ති කොටි සංවිධානය අතර තිබූ සටන් විරාම ගිවිසුම නිසා, නිත්‍යානුකූල සංවිධානයක් වූ දෙමළ විමුක්ති කොටි සංවිධානයේ සාමාජිකයෙකුව සිටියේ නැත. රගිහර් ප්‍රචණ්ඩ හෝ එසේ නොවූ හෝ කිසිම දේශපාලන සංවිධානයකට අනුබද්ධ වී සිටියේ නැත.

26. රගිහර් මනෝහරන්, 2006 ජනවාරි 02 වන දින ශ්‍රී ලංකා නාවික හමුදාව යටතේ පැවති ත්‍රිකුණාමල ප්‍රදේශයේ මහත්මාගාන්ධි පිලිරුව අසළ කතාබහේ යෙදී සිටි හත් දෙනාගෙන් එක් අයෙකි. ආසන්න වශයෙන් සවස 7.35ට පමණ කොල පැහැති මොටර් රික්ෂෝවකින් පැමිණි අය අතර අත් බෝම්බයක් පිපිරිණි. සිසුන් හත් දෙනාගෙන් පස් දෙනෙකුට මෙම පිපිරීමෙන් තුවාල සිදු විය. මූලිකව, අනතුරක් නොවූ දෙදෙනාගෙන් එක්කෙනෙකුවූයේ රගිහර් මනෝහරන්ය.

27. කොල පැහැති මොටර් රික්ෂෝව කිසිම බාධාවකින් තොරව හමුදා පිරික්සුම් කපොල්ලක් හරහා ශ්‍රී ලංකා යුධ හමුදා මුරපොලක් වූ ෆෙඩ්රික් කොටුව තුළට නොපෙනී ගියේය. රික්ෂෝව පිටත් වූවායින් පසුව ප්‍රදේශයේ හමුදා පලනයේ තිබූ සියළුම පිරික්සුම් කපොළු කඩිනමින් වසා දමන ලදි. පසුව එන පැය භාගය, ඉදිරි දර්ශනය වූ රගීහර් ඇතුළු දමිළ සිවිල් සිසුන් පස් දෙනාගේ නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිසු වූ ඝාතනයන් හා හුදකලා විය.

28. අත් බෝම්බය පුපුරා විනාඩි ගණනාවකට පසුව රගිහර් මනෝහරන් ඇතුළු සිසුන් කරා ජීප් රථයක් ලඟා විය. ජීප් රථය, වෙස් මුහුණු ලා ගත්, යුධ හමුදා හෝ ආරක්ෂක නිළදාරී නිළ ඇඳුමෙන් සැරසුණ කිහිපදෙනෙක් රැගෙන ආවේය. කෙටි වචන හුවමාරුවකින් පසුව, අසළ සිටි පුදුගලයන්ට සිසන් විසින් අනුකම්පාව දක්වන ලෙස ආයාචනා කරමින් මොර ගසන හඬ ඇසී තිබුණි. 2006 ජනවාරි 02 සවස 7.55ට ආසන්නව, වෙස් මුහුණු ලා ගත් පුද්ගලයන් සිසුන්ව තමන්ගේ ට්‍රක් රථයට තල්ලු කර දමා පහර දී බිමට දමා තමන්ගේ ස්වංක්‍රීය ආයුධ වලින් වෙඩි තබන ලදි. වගඋත්තරකරුගේ විධානය හා පාලනය යටතේ පවතින ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සාමාජිකයන් විසින් විදේශ නීතිය නොසලකා හරිමින් නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව රගිහර් ඇතුළු සිසුන් පස් දෙනා මරා දැමූ බව සියල්ලෝ පවසති.

29. අත් බෝම්බ පිපිරීමේ හඬ ඇසුණු පසු, පැමිණිලිකරු වෛද්‍ය මනෝහරන්, රගිහර්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විය. ඔහු රගිහර් හා ඔහුගේ මිතුරන් හමුවන ගාන්ධි පිලිරුව වෙත යෑමට සැණෙකින් පිටත් විය. ඔහුව ප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකා යුධ හමුදා සෝදිසි මුරපොලකදී නවත් වන ලදි.

30. ශ්‍රී ලංකා යුධ හමුදා නිළදාරියෙකු විසින්, ලග ඇති රෝහලේ ඔහුගේ පුත්‍රයාව සොයා බලන ලෙස, පැමිණිලිකරු මනෝහරන්ට උපදෙස් දුනි. ඔහු එසේ කළේය. ඔහු, මියගිය අය අතර සිටි තමාගේ පුත්‍රයාව හඳුනා ගත්තේය. තවද ඔහුගේ හිස පිටුපස අඟල් දෙකක් - දෙකහමාරක් වූ (2- 2.5) විවර වූ සිදුරු දෙකක් ඇති බව නිරීක්ෂණය කරන ලදි. රගිහර් මනෝහරන් ගේ නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කරන ලද මරණයෙන් පසු රෝහලේ සිටි, ශ්‍රී ලංකා නිරීක්ෂණ දූත මණ්ඩාලයේ ("SLMM") ප්‍රාදේශිය නායක Arthur Tveiten ක්ෂණිකව කෑ ගසා කීවේ "මේක මිනී මැරුමක්. මේවා වෙඩි තැබීමකින් සිදු වූ තුවාල. මේ පිරිමි ළමුන් මැරී තිබෙන්නේ පිපිරීමකින් නොවේ."

31. පොලිස් නිළධාරියෙකු විසින්, පැමිණිලිකරු වන මනෝහරන්ට රගිහර්ගේ මෘත දේහය භූමදාන කටයුතු කිරීමේ අයිතිය වෙනුවෙන් කොන්දේසියක් ලෙස රගිහර් විමුක්ති කොටි සංවිධානයේ සාමාජිකයෙකු බවට ප්‍රකාශනයකට අත්සන් කරන ලෙස රෝහලේදී ප්‍රකාශ කළේය. පැමිණිලිකරු එය ප්‍රතික්ෂේප කරමින් ඔහුගේ පුත්‍රයා කොටි සංවිධානයට අයත් නොවන බවට සහිතක කළේය. අවසානයේදී, පැමිණිලිකරු මෙම නිහීන බොරුව පිළි නොගත් අතර පසුව රගිහර්ගේ මෘත දේහය පැමිණිලිකරුට භාර දෙන ලදී

32. වගඋත්තරකරු, රගිහර් ඇතුළු සිසුන්, ට්‍රින්කො 5 ගේ නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද ඝාතන පිළිබඳව අවංක පරීක්ෂණයක් කිරීමෙන් වලකින ලෙස, ඍජුව හෝ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඇතුළු ඔහුගේ නියෝජිතයන් මගින් පොලිසියට උපදෙස් දෙන ලදි.

33. 2006 ජනවාරි 10 දින සවස පැමිණිලිකරු වෛද්‍ය මනෝහරන්ට මෑතකදී තමන්ට සිදුවූ අඩත්තේට්ටම් පිළිබඳ ප්‍රකාශනයක් ලබා දෙන ලෙස ඉල්ලමින් වරාය පොලිසියෙන් දුරකතන ඇමතුමක් ලැබුණි. පැමිණිලිකරු වෛද්‍ය මනෝහරන්, වරාය පොලිස් මූලස්ථානයේදී තමන්ට මුණ ගැසුණු සෆීර් නම් තැනැත්තා, පැමිණිලිකරුට කියා සිටියේ රගිහර්, ඔහුගේ පුත්‍රයාට මේස පන්දු ක්‍රීඩාව පිළිබඳ උපදෙස් දී ඇති බවයි. ඔහුගේ උපදෙස් නිසා තම පුතුට උතුරු නැගෙනහිර ශූරතාවය දිනා ගැනීමට හැකි වූ බව සෆීර් විශ්වාස කළේය. "ඩොක්ට අපි මේක කළේ නැහැ. මේ ඝාතනය එස්. ටී .එෆ් එකයි කළේ ,අපේ පොලිසියයි කියලා හිතන්න එපා" සෆීර් ඉන් පසු සඳහන් කළේය.

34. පැමිණිලිකරු මනෝහරන්ගේ, නැවත නැවත කරන ලද ප්‍රසිද්ධ ඉල්ලීම් මත වගඋත්තරකරු, ත්‍රිකුණාමලය සංහාරය හා නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද ඝාතන ගැන පරීක්ෂණයක් ආරම්භ කළේය. පසුව එය අත් හැර දමන ලදි. වගඋත්තරකරුගේ විධාන නියෝග හා පාලනය යටතේ පවතින ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා හෝ ආරක්ෂක හමුදා සාමාජිකයන් මගින්, විදේශ නීතිය නොසලකා හරිමින් නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද රගිහර් මනෝහරන්ගේ ඝාතනයේ වරදකරුවන් හඳුනා ගැනීමට හෝ ඔවුන් පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට වගඋත්තරකරු කිසිවක් නොකරන ලදි.

35. පැමිණිකරු මනෝහරන් තම පුතුගේ, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද ඝාතනය පිළිබඳ පරීක්ෂණ කිරීමට අධිෂ්ඨානාත්මකව කරන ලද ඉල්ලීම් හේතුකොට ගෙන ඇති වූ ජීවිත තර්ජන නිසා ශ්‍රී ලංකාවෙන් පලා යෑමට බල කෙරිණි.

36. වගඋත්තරකරුට, මෙම කරුණ ඉදිරියේ ඔහුගේ විධානය හා පාලනය යටතේ සිටින පුද්ගලයන්ගෙන් නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද රගිහර් මනෝහරන්ගේ මරණය

ගැන දැන සිටියා හෝ දැන ගැනීමට හේතු තිබුණා වුවත් එය නැවැත්වීමට කිසිත් නොකරන ලදි. වගඋත්තරකරුට, ඔහුගේ විධානය හා පාලනය යටතේ, නීතිමය ක්‍රියාදාමයකින් පරිබාහිරව කරන ලද ඝාතනයේ වගකිව යුත්තන් දැන සිටියා හෝ දැන ගැනීමට හේතු තිබුණා වුවත් වරදකරුට දඬුවම් කිරීමට කිසිත් නොකරන ලදි. වගඋත්රකරු ඕනෑකමින්ම, නීතිමය ක්‍රියාදාමයකින් පරිබාහිරව කරන ලද "ට්‍රින්කො 5" ඝාතනයේ වැරදිකරුවන් පරීක්ෂණයක් මගින් හඳුනා ගැනීමට හෝ නීතිය ඉදිරියට පැමිණවීමට පෞද්ගලිකවම අවහිර කිරීම හෝ නොසලකා හැරීම කරන ලදි.

## මූතූර් සංහාරය

37. 2006 අගෝස්තු පස් වන දින හෝ ඊට ආසන්න දිනෙක සවස 7.50ට පමණ ශ්‍රී ලංකා යුධ හමුදා හෝ රාජ්‍ය අනුග්‍රහය ලත් අතුරු හමුදා, සාගින්නට එරෙහි ක්‍රියාකාරිත්වය මගින් සේවයේ යොදවා සිටි සිවිල් සහන සේවකයින් 17 දෙනා වෙඩි තබා ඝාතනය කරන ලදි.

38. ACF මෙලෙස ඔවුන්ව හඳුනා දෙයි:
සාගින්නට එරෙහි ක්‍රියාකාරිත්වය/ ACF ජාත්‍යන්තරය ලෝකයේ කුසගින්න නිවන්නට කැප වූ මානව හිතවාදී ගෝලීය සංවිධානයකි. ඌණ පෝෂිතභාවයට එරෙහිව සටන් කරන මූලිකයා වශයෙන් හඳුනා ගත් ACF, ප්‍රජාවන්ට පිරිසිදු ජලය, කුසගින්න නිවීමට ප්‍රතිකර්ම සලසමින් ඌණ පෝෂිත දරුවන්ගේ ජීවිත බේරා ගනී. ගැටුම්කාරී හදිසි තත්ත්වයන් තුළ ස්වභාවික ව්‍යසන, බොහෝ කාලයක් තුළ පවතින ආහාර අනාරක්ෂිතභාවය තුළ, ලත් අවුරුදු 30 සේවාවෙන් ලත් විශේෂ දැනුමත් සමග ACF, මිලියන පහකට වඩා ජනතාවක් ප්‍රතිලාභ ලබන, රටවල් 40ක පමණ ජීවිත සුරැකුම් වැඩසටහන් සෑම අවුරුද්දකම දියත් කරනු ලබයි. රටවල් 40 කට වැඩි ගණනක සේවයෙහි නියුතු ACF හි විද්වත් වෘත්තිකයන් 4600 දෙනෙක්, පෝෂණය, ආහාර සුරක්ෂිතභාවය, ජීවනෝපාය, ජලය, පවිත්‍රතාවය, සනීපාරක්ෂාව වැනි නව උත්පාදක දිවි සුගරැකුම් වැඩසටහන් ක්‍රියාත්මක කරති. ACF හි මානවහිතවාදී වැඩසටහන් මගින් වසරකට මිලියන 5කට වැඩි ජනතාවකටත් ඊට සමාන්තරව රාජ්‍ය අමාත්‍යංශ සමඟ ඒකාබද්ධව ගිනිය නොහැකි තරම් වු තවත් පිරිසකටත් සහය වේ. ප්‍රතිපත්ති මත පිහිටි මානව හිතවාදී ක්‍රියාකාරිත්වයකට කැප වුණු සාගින්නට එරෙහි ක්‍රියාකාරිත්වය (ACF) ලෝකය පුරා සිටින අනාරක්ෂිත ජනගහනයන්ගේ ආත්ම අභිමානය, ස්වංපෝෂිතභා වයස හා නිදහස, නගා සිටුවීමට කටයුතු කරති. (ACF ජාත්‍යන්තරය, "අපි කවුද?" යනුවෙන් 2011 ජනවාරි 24 වන දින http://www.actionagainsthuner.org/who-we-are/acf-international-network හි සඳහන් වේ. අවසන්වරට පිවිසියේ 2011 ජනවාරි 24).

39. ජත්‍යන්තර ප්‍රකාශන පත්‍රයේ ACF යනු ඉතාමත් මධ්‍යසථ සංවිධානයක් බව විස්තර කරයි. ඔවුන්ගේ වෙබ් අඩවිය විස්තරාත්මකව මෙලෙස සඳහාන් කරයි.

**ස්වාධීනත්වය**
සාගින්නට එරෙහි ක්‍රියාකාරිත්වය සිය ප්‍රතිපත්ති අනුව සදාචාරය හා ආර්ථික ස්වාධීනත්වය පවතත්වාගනී. එය අභ්‍යන්තර හෝ විදේශ ප්‍රතිපත්තීන් මත ක්‍රියා නොකරන අතර කිසිදු රජයක අවශ්‍යතා පරිදි ක්‍රියානොකරයි.

**මධ්‍යස්ථභාවය**
සාගින්නට එරෙහි ක්‍රියාකාරිත්වය දේශපාලන හා ආගමික මධ්‍යස්ථභාවය ඉතා ඉහළින්ම

පවත්වාගෙන යයි. කෙසේවෙතත් එහි මානුෂික ක්‍රියාකාරිත්වය තුළ මානවහිමිකම් සහ බාධාකිරීම් හෙලා දකී.

**වෙනස්කම් කොට සැලකීමට එරෙහිවීම**
වින්දිතයා වින්දිතයෙකි. සාගින්නට එරෙහි ක්‍රියාකාරිත්වය වාර්ගික , ජාතික, මතය, ජාතිය, ආගම, ලිංගිකත්වය හෝ සමාජතත්ත්වය මත පදනම් වූ වෙනස්කම් කොට සැලකීම් ප්‍රතික්ෂේප කරයි. (ACF International, "Charter" 24-01-2011, http://www.actionagainsthuner.org/who-we-are/international-charter. හි සඳහන් වේ. අවසන්වරට පිවිසියේ 2011 ජනවාරි 24).

40. දැඩි මධ්‍යස්ථ ප්‍රතිපත්ති අනුව ACF, 2009 මැයි මස අවසන් වූ දීර්ඝකාලීන වාර්ගික යුද්ධය පැවති කාලය තුළදී, එල්.ටී.ටී.ඊ සංවිධානයට හෝ රජයට සහය දැක්වූයේ නැත. මෙම පැමිණිල්ලට අදාළව සෑම කාලයකම, ACF, දරිද්‍ර හෝ අනතුරට ලක් වූ ශ්‍රී ලංකා සිවිල් වැසියන් හට ආධාර පහසුකම් සැලසීමට, ත්‍රිකුණාමලය, මූතූර් සහ ශ්‍රී ලංකාවේ වෙනත් තැන්වල කාර්යාල පවත්වාගෙන යන ලදි.

41. 2006 ජූලි 31 සහ අගෝස්තු 1 උදේ ත්‍රිකුණාමලයේ සිට මූතූර් වලට එහි මානුෂික ආධාර ප්‍රයත්නයන් ක්‍රියාත්මක කිරීමට හා අධීක්ෂණය කිරීමට, ACF සහන සේවකයන් 17 දෙනෙකු පිටත් කර යැවිණි. කණ්ඩායම 2006 අගොස්තු 1 ආපසු පැමිණීමට නියමිතව තිබුණි. කණ්ඩායම ඉවත්වීමට පෙර එල්.ටී.ටී.ඊ හමුදාව මූතූර් වලට ප්‍රහාරයක් එල්ල කරන ලදි අතරමං වූ කණ්ඩායමේ, ආරක්ෂාව හා සිදු කළ හැකි ඉවත් කර ගැනීමේ උත්සාහයන් සම්බන්ධීකරණය කිරීමට මූතූර් භූමිය හා ගුවන් විදුලි සංඥා සම්බන්ධතා පවත්වාගෙන යෑමට ACF, ත්‍රිකුණාමල කාර්යාලයට නියෝග කෙරිණි.

42. 2006 අගේස්තු 02 අවසාන වන විට ACF, කණ්ඩායම අප්‍රමාදව ඉවත් කර ගැනීම අනුමාන බව පෙනී ගියේය. ඒ අනුව මූතූර් කණ්ඩායම විදේශීය මානව හිතවාදී සංවිධානයක් ලෙස, තමන් රැඳී සිටි භූමිය මධස්ථභාවයේ පැහැදිලි සළකුණු වලින් කැපී පෙනෙන ලෙස හුවා දක්වා තිබුණි. ත්‍රිකුණාමලය කාර්යාලය සෑම පැය බාගයකට වරක් කණ්ඩායම සමග සම්බන්දතා නැවත ස්ථාපිත කර ගන්නා ලදි.

43. 2006 අගෝස්තු හෝ ඊට ආසන්නව, වගඋත්තරකරුගේ බලය යටතේ පවතින ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව, පොලීසිය වෙත ඔවුන්ගේ මූතූර් භූමියේ නිශ්චිත පිහිටීම (අක්ෂාංශ දේශාංෂ වශයෙන්) ACF, නියෝජිතයන් විසින් සපයන ලදි. ACF, වගඋත්තරකරුගේ විධාන බලය යටතේ පවතින ශ්‍රී ලංකා යුධ හමුදා නිළදාරින්ට, තමන්ගේ සාමකාමී මානව හිතවාදී මෙහෙවර ගැන යලි තහවුරු කරන ලදි.

44. 2006 අගෝස්තු 04 වන දින පෙරවරු 7ට පසු ACF, මූතූර් කණ්ඩායම සමග ගුවන්විදුලි සංඥා සම්බන්දතාවය ඇණහිටිය. මෙය, හදිසි ඉවත් කර ගැනීමේ සැලසුමක් ක්ෂණයකින් ක්‍රියාත්ම කිරීමට ACF, පෙළඹවීය. නමුත් මූතූර් සිට කි.මී 10 දුරින් පිහිටි ශ්‍රී ලංකා යුධ හමුදා සෝදිසි මුරපොලේ දී ඉවත් කර ගැනීමේ ආරක්ෂක කණ්ඩායමට තුවක්කු එල්ල කර, ආපසු හරවා යවන ලදි.

45. 2006 අගෝස්තු 05 වන දි කණ්ඩායම, මූතූර් වලින් ඉවත් කර ගැනීමට ACF, තමන්ගේ දෙවන

උත්සාහයද දැරිය. මෙවර තවත් මධ්‍යස්ථ මානවහිතවාදී සංවිධානයක් වූ ශ්‍රී ලංකා අධීක්ෂණ දූත කණ්ඩායම ("SLMM") හා සහයෝගයෙන්, මුතූර් වලට ඇතුළුවීමට යත්න දැරිය. නැවතත් කණ්ඩායම, ශ්‍රී ලංකා යුධ හමුදා පිරික්සුම් මුරපොලේදී නවත් වන ලදි.

46. වගඋත්තරකරු විසින් ACF, ක්‍රියාකාරිත්වයට මුතූර් වලට ලඟා වීමට නැවත නැවත ප්‍රතික්ෂේප කිරීමෙන්, ACF, මානවහිතවාදී ආධාර සේවකයන් වූ සිවිල් වැසියන් 17දෙනා විදේශ නීතිය නොසලකා හරිමින්, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව ඝාතනය කිරීමට, වගකිව යුත්තන් හඳුනා ගැනීමේ උත්සහයන්ට බාධා කිරීමට සැලසුම් කරන ලදි.

47. 2006 අගෝස්තු 06 වන දින මානවහිතවාදී නියෝජිත ආයතන කොන්සෝටියම (CHA) මගින් යවන ලද කණ්ඩායම ගොඩබිම් මාර්ගයෙන් මුතූර් වලට ලඟාවීමට සමත් විය. CHA කණ්ඩායම, අතරමං වූ ACF, සේවකයන් 17 දෙනාගෙන් 15 දෙනෙකුගේ මල සිරුරු, භූමියේ පිටුපස ගේට්ටුව අසළ වැතිරී තිබී සොයා ගන්නා ලදි. ඉතිරි ACF, සේවකයන් දෙදෙනාගේ මළ සිරුරු ගේට්ටුවට මදක් දුරින් හමු විය.

48. ගිනි අවි වලින් සිදු වූ තුවාල මෙම මරණයන්ට හේතු විය.

49. මුතූර් හි ACF, සේවකයින් 17 දෙනා, වගඋත්තරකරුගේ විධාන පාලනය යටතේ පවතින, ශ්‍රී ලංකා පොලීසියේ , යුධ හමුදාවේ , නාවික හමුදාවේ හෝ අනිකුත් යුධමය හෝ අතුරු කණ්ඩායම් වල සාමාජිකයන් විසින් නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව, විදේශ නීතිය නොසලකා, 2006 අගේස්තු 04 වන දා මරා දමන ලද, යුධ පිටියේ නොසිටි සිවිල් වැසියෝ වෙති.

50. ACF, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කරන ලද තම සාමාජිකයන් 17 දෙනාගේ ඝාතන පිළිබඳ පරීක්ෂණ පවත්වන ලෙස ඉල්ලා සිටියේය. වඋත්තරකරුගේ විධානය හා පාලනය යටතේ සිටින වැරදිකරුවන් නීතිය ඉදිරියේ වගකීම් සහිත බවින්, ඔවුන් ආරක්ෂා කිරීමේ අරමුණින් වගඋත්තරකරු විසින් මෙහෙය වන ලද පරීක්ෂණය වංචාවකි. වැරදිකරුවන් හඳුනා ගැනීමට පෙර එය අහෝසි කරන ලදි.

51. ප්‍රීමස් ආනන්දරාජා, ශ්‍රී ලංකා සන්නද්ධ අමුදා මගින් හෝ ආරක්ෂක සේවාවන් මගින්, විදේශ නීතිය නොතකා 2006 අගෝස්තු 04 නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කරන ලද ඝාතනයට ගොදුරු වූ ACF, 17 දෙනාගෙන් එක් අයෙකි.

52. මෙම කරුණ ඉදිරියේ වගඋත්තරකරු, ප්‍රීමස් ආනන්දරාජාගේ, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කරන ලද ඝාතනය, දැන සිටියා හෝ දැන ගැනීමට කරුණු තිබුණා වුවත් හෝ එම අපරාධය වැලැක්වීමට කිසිත් නොකළේය. මෙම කරුණෙන් පසු වගඋත්තරකරු මෙම අපරාධයේ වගකිවයුත්තන් කවුදැයි කියා දැන සිටියා වුවත් හෝ දැන ගතයුතුව තිබුණා වුවත් වරදකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒමේ සියළු උත්සහයන් ව්‍යර්ත කරවීය. පැමිණිලිකරු ලාවාන්, තමන්ගේ ස්වාමපුරුෂයා වූ ප්‍රීමස්රාජාගේ නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කරන ලද ඝාතනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ අධිකරණමය සහනයක් ලබා ගැනීමට කරන ඕනෑම ප්‍රයත්නයක්, එහි අධිකරණය දේශපාලනමය සම්මුතියකට පත් කර ඇති බැවින්, නිෂ්ඵල වන අතර, ලාවාන් එහි පා තැබුවොත් ඝාතනයට ලක් විය හැක.

.

**මූලතිවු සංහාරය**

53. 2009 මැයි මාසය තුළදී, මුලතිවු මුහුදු තීරයේ ඉතා පටු ගොඩබිම් තීරයක් වූ මුල්ලෙවෙක්කාල් හි පැහැදිලිව සලකුණු කර තිබූ "යුධ මුක්ත කලාපයේ" බන්කර් තුළට වී සිටි, දන්නා අදුනන දෙමළ සිවිල් වැසියනට ශ්‍රී ලංකා නාවික හමුදා භටයන්ගෙන් යුත් නෞකාවන් මගින් වෙඩි තබන ලදි.

54. ශ්‍රී ලංකා දෙමළ සිවිල් වැසියන් වූ තේවරාජ්ලා, විදේශ නීතිය නොතකා, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කරන ලද ඝාතනයකට ලක් වූ වන් අතර සිටිති.

55. "තේවරාජ්ලා" කිලිනොච්චියෙන් පැවත එන්නෝ වෙති. ශ්‍රී ලංකා ජනවාර්ගික සිවිල් යුද්ධයේදී ඔවුහු බොහෝ වාරයක් අවතැන් වූහ.

56. "තේවරාජ්ලා" මුල්ලෙවෙක්කාල් යනුවෙන් හඳුන්වනු ලබන පටු බිම් තීරුවක, වගඋත්තරකරු විසින් සළකුණු කරන ලද "යුධ මුක්ත කලාපයේ" 300,000 අධික, ගාල් කරන ලද දමිළ වැසියන් අතුරින් හතර දෙනෙකි.

57. ප්‍රහාරය සිදු වූ කාලයේ, ශ්‍රී ලංකා යුධ හමුදාව හා ශ්‍රී ලංකා නාවික හමුදාවන ඇතුළු, වගඋත්තරකරුගේ ආරක්ෂක හමුදාවන්, මුල්ලෙවෙක්කාල් සහ ඒ අවට ප්‍රදේශවල ක්‍රියාන්විත වූයේ වගඋත්තරකරු රාජපක්ෂගේ විධාන වගකීම යටතේය.

58. "තේවරාජ්ලා" ශ්‍රී ලංකා නාවික හමුදාවේ බෝම්බ හෙලීම් වලින් ආරක්ෂාවීමට සරණ සොයාගත්තේ තාවකාලික බන්කරයකි. නමුත් 2009 මැයි 14 වන දින ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් එල්ල කරන ලද ආටිලරි ෂෙල් ප්‍රහාරයක් ඔවුන්ගේ බන්කරයට වැදී තේවරාජ්ලා තිදෙනෙක් සහ අවතැන් වූ බොහෝ දමිළ සිවිල් වැසියන් මරණයට පත් වූහ.

59. තවරාජා තේවරාජා, විදේශ නීතිය නොසලකා හරිමින් ශ්‍රී ලංකා නාවික හමුදාව, 2009- 05-14 වන දින, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද ඝාතනයන්ගෙන් තාවකාලිකව බේරුණු කෙනෙකි. රතු කුරුස සංවිධානය ඔහුව අනුරාධපුර රෝහලට ගෙන ආ අතර, ඔහුට සිදු වී තිබූ තුවාල නිසා 2009-06-17 වන දින ඔහු මිය ගියේය.

60. "තේවරාජ්ලා" ගේ මරණ, යුද්ධය කාලයේදී ගැටුම් කලාපයෙන් පිටත, විදේශ නීතිය නොසලකාහරිමින්, ජාත්‍යන්තර නීතිය හා වධහිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත (TVPA) උල්ලංඝනය කරමින් වගඋත්තරකරු රාජපක්ෂගේ විධානය හා පාලනය යටතේ පැවති ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා හෝ ආරක්ෂක සේවාවන්ගේ සාමාජිකයන් විසින් නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව, අහිංසක සිවිල් වැසියන් ඝාතනය කිරීමකි.

61. වගඋත්තරකරු රාජපක්ෂ, මෙම කරුණ ඉදිරියේ නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව, සිදු වූ තේවරාජ්ලාගේ ඝාතන දැන සිටියා හෝ දැන ගැනීමට කරුණු තිබුණා වුවත්, එම අපරාධය නැවැත්වීමට කිසිදු පියවරක් ගත්තේ නැත. වගඋත්තරකරු, විදේශ නීතිය නොසලකා හරිමින් නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව තේවරාජ්ලාගේ ඝාතනයන්ට වගකිව යුතු වරදකරුවන් දැන සිටියා හෝ දැන ගතයුතුව තිබුණා හෝ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ එම වරදකරුවන් නීති මාර්ගයට පමුණුවීමට කිසිත් නොකරන ලදි.

62. ශ්‍රී ලංකාවේ අධිකරණය දේශපාලනික සම්මුතියකට පත් කර ඇති බැවින් හා එය වගඋත්තරකරුගේ සම්පූර්ණ පාලනය යටතේ පවතින බැවින්, පැමිණිලිකරු අයියදුරෙ, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව, මරා දමන ලද තම තේවරාජා ඥාතීන් වෙනුවෙන් ශ්‍රී ලංකාව

කිරීම යටතේ යුධ අපරාධයක් බවට පත්වේ.

73. වගඋත්තරකරු රාජපක්ෂ ශ්‍රී ලංකාවේ ජනාදිපති වශයෙන්, මෙම පැමිණිල්ලට අදාලව සෑම විටම, ශ්‍රී ලංකා යුධහමුදාව හා අනිකත් සියළුම ආරක්ෂක හමුදාවල විධාන බලය ඍජුවම හෝ ශ්‍රී ලංකා ආරක්ෂක ලේකම් වන තම සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ මගින් හෝ වෙනත් ලෙසකට හෝ අභ්‍යාස කර ඇත.

74. වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකා නීතිය නොසලකා හරිමින්, නීතියට පරිභාහිරව කරන ලද ප්‍රීමස් ආනන්දරාජාගේ ඝාතනය, මෙම කරුණ ඉදිරියේ යුධ අපරාධයක් වන බව දැන සිටියා හෝ දැනගතයුතුව තිබුණා වුවත්, එම අපරාධය වැලැක්වීමට කිසිදු උත්සහයක් දැරුවේ නැත. වගඋත්තරකරු මෙය දැන සිටියත්, දැන ගැනීමට හැකියාව තිබුණත් විදේශ නීතිය නොසලකා හරිමින්, නීතියට පරිභාහිරව සිදු කරන ලද ආනන්දරාජාගේ ඝාතනයේ, වැරදිකරුවන්ට දඬුවම් කිරීමට කිසිත් නොකරන ලදි.

75. වගඋත්තරකරු රාජපක්ෂ එහි අධිකරණ පද්ධතිය දේශපාලනික සම්මුතියකට පත් කර ඇති බැවින් නීතිමය ක්‍රියාදාමයකට පරිභාහිරව කරන ලද ආනන්දරාජාගේ ඝාතනයට ශ්‍රී ලංකාව තුළ පිලියම් සෙවීම නිෂ්ඵලය. තවද පැමිණිලිකාරිය හෝ ඇගේ නියෝජිතයන් ශ්‍රී ලංකාවට පය තැබීම ජීවිත අවදානමකි.

76.නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද ප්‍රීමස් ආනන්දරාජාගේ ඝාතනය, 1991 ප්‍රකාශිත L. 102-256, 106 Stat. 73 (1992 මාර්තු 12) වධ හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කර ඇත. මෙම ඝාතනය පැහැදිලිව අදුනා ගත හැකි, ආසන්නව ඩොලර් මිලියන පහකට වඩා අධික හානියක් පැමිණිලිකරුට කර ඇත.

**චෝදනාංකය iii: වධහිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කිරීම**

77. ඡේද 1-76 පැමිණිලිකරුවන් ප්‍රතිචෝදනා කරති.

78. පැමිණිලිකරු ජෙයකුමාර් අයියදුරෙ අදාල නීතිය යටතේ, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද ඝාතනයන්ට ලක්වූ, නැසී ගිය තම ඥාතියෙකු වූ පරමේෂ්වරී තවරාජාගේ නිත්‍යානුකූල නියෝජිතයාවේ.

79. පරමේෂ්වරී තවරාජා, යුධපිටියෙන් පිට හා නිත්‍යානුකූල යුධමය අරමුණකින් තොරව ශ්‍රී ලංකා නාවික හමුදාව හෝ අනිකුත් ශ්‍රී ලංකා ආරක්ෂක අංශ මගින් ඝාතනය කරන ලද සිවිල් වැසියෙකි. ඇගේ ඝාතනය ජාත්‍යන්තර නීතිය යටතේ හා වධහිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය මගින් යුධ අපරාධයක් බවට පත්වේ.

**80.** වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකාවේ ජනාධිපති වශයෙන් මෙම පැමිණිල්ලට අදාලව, සැමවිටම, ශ්‍රී ලංකා නාවික හමුදාවට හා අනිකුත් සියළුම ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවලට විධාන වගකීම, ඍජුවම හෝ ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් වන තම සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ මගින් හෝ වෙනත් අයුරකින් හෝ අභ්‍යාස කොට ඇත.

81. වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකා නීතිය නොසලකා හරිමින්, නීතිමය ක්‍රීයාදාමයකින් පරිභාහිරව කරන ලද පරමේෂ්වරී තේවරාජාගේ ඝාතනය මෙම කරුණ ඉදිරියේ, යුධ අපරාධයක් වන බව දැන සිටියා හෝ දැනගත යුතුව තිබුණා වුවත් එම අපරාධය වැලැක්වීමට කිසිදු

තුල අධිකරණමය පිලියමක් ලබා ගැනීමට උත්සාහ කිරීම නිෂ්ඵල ක්‍රියාවකි. තවදුරටත්, අයියදුරෙ‍රේ ශ්‍රී ලංකාවට පය තැබුවොත්, ඔහු ඝාතනයට ලක් වීමට ඉඩ ඇත.

**චෝදනාංකය I: වධහින්සාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කිරීම**

63. ඡේද 1-62 පැමිණිලිකරුවන් ප්‍රතිචෝදනා කරති.

64. පැමිණිලිකරු වු කාසිපිල්ලෙල මනෝහරන්, අදාල නීතිය යටතේ, විදේශ නීතිය නොතකා වගඋත්තරකරුගේ විධානය හා පාලනය යටතේ, නීතිමය ක්‍රියාදාමයකින් පරිබාහිරව, සිදු කරන ලද ඝාතනයකට ගොදුරු වූ තම පුත් රගිහර් මනෝහරන්ගේ නීත්‍යානුකූල නියෝජිතයාය.

65. රගිහර් මනෝහරන්, මොනයම් හෝ නීත්‍යානුකූල යුධ අරමුණකින් තොරව. යුධ පිටියකින් පරිබාහිරව, ශ්‍රී ලංකා යුධ හමුදාව හෝ අනිකුත් ශ්‍රී ලංකා ආරක්ෂක අංශ මගින් ඝාතනයට ලක් වූවෙකි.

66. වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකාවේ ජනාධිපති වශයෙන්, මෙම පැමිණිල්ලට අදාල සෑම කාලයකදීම, ශ්‍රී ලංකා යුධ හමුදාව හා අනෙකුත් සියළුම ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් මත ඍජුව හෝ ශ්‍රී ලංකා ආරක්ෂක ලේකම් වන ඔහුගේ සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ මගින් හෝ වෙනත් අයුරකින් හෝ තම විධාන වගකීම අභ්‍යාස කොට ඇත.

67. වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකා නීතිය නොසලකා, නීතිමය ක්‍රියාදාමයකින් පරිබාහිරව, සිදු කරන ලද රගිහර් මනෝහරන්ගේ ඝාතනය මෙම කරුණ ඉදිරියේ යුධ අපරාධයක් වන බව දැන සිටියා හෝ දැනගත යුතුව සිටියා හෝ වුවත් එම අපරාධය වැලැක්වීමට කිසිදු උත්සාහයක් දරා නැත. වගඋත්තරකරු, මෙම කාරණයෙන් පසු, රගිහර් මනෝහරන්ගේ නීතිමය ක්‍රියාදාමයකින් පරිබාහිරව, සිදු කරන ලද ඝාතනය දැන සිටියා හෝ දැනගත යුතුව සිටියා හෝ වුවත් වැරදි කරුවන්ට දඩුවම් කිරීමට කිසිත් නොකරන ලදි.

68. වගඋත්තරකරු රාජපක්ෂ එහි අධිකරණ පද්ධතිය දේශපාලනික සම්මුතියකට පත් කරගෙන ඇති බැවින්, රගිහර් මනෝහරන් අධිකරණමය ක්‍රියාදාමයකින් පරිබාහිරව මරා දැමීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ, ඊට පිලියම් සෙවීම නිෂ්ඵලය.

69. නීතියෙන් පරිබාහිරව, රගිහර් මරා දැමීම, 1991 ප්‍රකාශිත L. 102-256, 106 Stat. 73 (1992 මාර්තු 12) වධ හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කර ඇත. මෙම ඝාතනය, පැහැදිලිව දැක ගත හැකි, ආසන්නව ඩොලර් මිලියන පහකට වඩා අධික හානියක් පැමිණිලිකරු වන මනෝහරන්ට සිදු කර ඇත.

**චෝදනාංකය II: වධහින්සාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කිරීම**

70. ඡේද 1-69 පැමිණිලිකරුවන් ප්‍රතිචෝදනා කරති.

71. පැමිණිලිකරු කලෛයිසෙල්වි ලාවාන් අදාල නීතිය යටතේ, නැසී ගිය තම මුල් ස්වාමි පුරුෂයා වන ප්‍රිමස් ආනන්ද රාජාගේ නිත්‍යානුකූල නියෝජිතවරිය වේ.

72. ප්‍රිමස් ආනන්ද රාජා සිවිල් සහනාධාර සේවකයෙක් වූ අතර, කිසිම යුධමය අරමුණක් නොමැතිව, යුධ පිටියෙන් පිටත, ශ්‍රී ලංකා යුධ හමුදාව හෝ වෙනත් ශ්‍රී ලංකා ආරක්ෂක අංශ මගින් විදේශ නීතිය නොසලකා හරිමින් නීතියට පරිබාහිරව කරන ලද ඝාතනයන්ට ලක් වූවෙකි. මෙම ඝතනය ජාත්‍යන්තර නීතිය හා වධහංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය

උත්සාහයක් දැරුවේ නැත. වගඋත්තරකරු පරමේෂ්වරී තේවරාජාගේ, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද ඝාතනය දැන සිටියා හෝ දැනගත යුතුව තිබුනා වුවත් වරදකරුවනට දඩුවම් කිරීමට කිසිත් නොකරන ලදි.

82. වගඋත්තරකරු රාජපක්ෂ, එහි අධිකරණ පද්ධතිය දේශපාලන සම්මුතියකට පත් කර ඇති බැවින්, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද පරමේෂ්වරී තේවරාජාගේ ඝාතනයට ශ්‍රී ලංකාව තුළ පිලියම් සෙවීම නිෂ්ඵලය. තවදුරටත්, පැමිණිලිකරු අයියදුරෛ හෝ ඔහුගේ නියෝජිතයින් ශ්‍රී ලංකාවට පය තැබීම ජීවිත අවධානමකි.

83. නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද පරමේෂ්වරී තේවරාජාගේ ඝාතනය 1991 ප්‍රකාශිත, L. 102-256, 106 Stat. 73 (1992 මාර්තු 12) වධ හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කර ඇත.මෙම ඝාතනය, පැහැදිලිව හඳුනා ගත හැකි, ආසන්නව ඩොලර් මිලියන පහකට වඩා අධික හානියක් පැමිණිලිකාරියට සිදු කර ඇත.

**චෝදනාංකය iv: වධහිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කිරීම**

**84.**ඡේද 1-83 පැමිණිලිකරුවන් ප්‍රතිචෝදනා කරති.

85. පැමිණිලිකරු ජෙයකුමාර් අයියදුරෛ අදාළ නීතිය යටතේ නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද ඝාතනයකට ලක් වූ නැසී ගිය තම ඥාතියෙකු වූ විජේමාලා තේවරාජාගේ නීත්‍යානුකූල නියෝජිතයාය.

86. විජේමාලා තේවරාජා යුධ කලාපයෙන් පිටත, මොනයම් හෝ නිත්‍යානුකූල යුධමය අරමුණකින් තොරව ශ්‍රී ලංකා යුධ හමුදාව හෝ ශ්‍රී ලංකා අනිකුත් ආරක්ෂක හමුදා මගින් ඝාතනය කරන ලද සිවිල් වැසියෙකි. ඇගේ ඝාතනය ජාත්‍යන්තර නීතිය යටතේ හා වධහින්සාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය මගින් යුධ අපරාධයක් බවට පත්**වේ.**

**87.** වගඋත්තරකරු රාජපක්ෂ ශ්‍රී ලංකාවේ ජනාධිපති වශයෙන්, මෙම පැමිණිල්ලට අදාලව සෑම විටම, ශ්‍රී ලංකා යුධහමුදාවට, ශ්‍රී ලංකාවේ නාවික හමුදාවට හා අනිකුත් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට විධාන වගකීම ඍජුවම හෝ තම සහෝදරයා වන ශ්‍රී ලංකා ආරක්ෂක ලේකම් තුළින් ක්‍රියාවට නැංවිණ.

88. වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකා නීතිය නොසලකා හරිමින් නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව, විජයමාලා තේවරාජාගේ ඝාතනය සිදු වන බව හා මෙම කරුන ඉදිරියේ යුධ අපරාධයන් වන බව දැන සිටියා හෝ දැනගතයුතුව තිබුණා වුවත් එම අපරාධය වැලැක්වීමට කිසිදු උත්සහයක් දරා නැත. වගඋත්තරකරු මෙම කරුණෙන් පසු, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව කරන ලද විජේමාලා තේවරාජාගේ ඝාතනය දැන සිටියා හෝ දැනගතයුතුව තිබුණා හෝ වැරදි කරුවන්ට දඩුවම් කිරීමට කිසිත් නොකරන ලදි.

89. වගඋත්තරකරු රාජපක්ෂ, එහි අධිකරණ පද්දතිය දේශපාලනික සම්මුතියකට පත් කර ඇති බැවින්, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කර ඇති විජයමාලා තේවරාජාගේ ඝාතනය ශ්‍රී ලංකාව තුළ පිලියම් සෙවීම නිෂ්ඵලය. තව දුරටත් පැමිණිලිකරු අයියදුරෛයි හෝ ඔහුගේ නියෝතයන් ශ්‍රී ලංකාවට පය තැබීම ජීවිත අවධානමකි.

90. නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කරන ලද විජයමාලා තේවරාජාගේ ඝාතනය මඟින්

1991 ප්‍රකාශිත, L. 102-256, 106 Stat. 73 (1992 මාර්තු 12) වධ හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කර ඇත. මෙම ඝාතනය පැහැදිලිව අඳුනා ගත හැකි, ආසන්නව ඩොලර් මිලියන පහකට වඩා අධික හානියක් පැමිණිලිකරුට කර ඇත.

**චෝදනාංකය v: වධහිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කිරීම**

91. ඡේද 1-90 පැමිණිලිකරුවන් ප්‍රතිචෝදනා කරති.

92. පැමිනිලිකරු ජෙයකුමාර් අයියදුරෛ, අදාල නීතිය යටතේ, නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කරන ලද, නැසී ගිය ඔහුගේ ඥාතියෙකු වන තවරාජා තේවරාජාගේ නීත්‍යානුකූල නියෝජිතයාය.

93. තවරාජා තේවරාජා, යුධ පිටියෙන් පිටත, මොනයම් හෝ නීත්‍යානුකූල යුධ අරමුණකින් තොරව, ශ්‍රී ලංකා යුධ හමුදාව හෝ වෙනත් ශ්‍රී ලංකා ආරක්ෂක අංශ මගින්, ඝාතනය කරන ලද සිවිල් පුරවැසියෙකි. ඔහුගේ ඝාතනය ජාත්‍යන්තර නීතිය යටතේ හා වධහිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත (TVPA) කඩ කිරීම මගින් යුධ අපරාධයක් බවට පත් වේ.

94. වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකා ජනාධිපති වශයෙන් මෙම පැමිණිල්ලට අදාළව, සැමවිටම, ශ්‍රී ලංකා යුධ හමුදාවට හා අනිකුත් සියළුම ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට විධාන වගකීම ඍජුවම හෝ, තම සොයුරා වන ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මගින් හෝ වෙනත් අයුරකින් හෝ අභ්‍යාස කොට ඇත.

95. වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකා නීතියට පටහැනිව, නීතිමය ක්‍රියාවලියකින් පරිභාහිරව, තවරාජා තේවරාජාගේ ඝාතනය සිදු වන බව හා මෙම කරුන ඉදිරියේ එය යුධ අපරාධයක් වන බව දැන සිටියා හෝ දැන ගත යුතුව තිබුණා වුවත්, මෙම අපරාධය වැලැක්වීමට කිසිදු උත්සහයක් දරා නැත. මෙම කරුණෙන් පසු,නීතිමය ක්‍රියාවලියකින් පරිභාහිරව සිදු කරන ලද තවරාජා තේවරාජාගේ ඝාතනය, වගඋත්තරකරු දැන සිටියා හෝ දැන ගත යුතුව තිබුණා හෝ වැරදිකරුවන්ට දඬුවම් කිරීමට කිසිත් නොකරන ලදි.

96. වගඋත්තරකරු රාජපක්ෂ, එහි අධිකරණ පද්ධතිය දේශපාලන සම්මුතියකට පත් කර ඇති බැවින්, නීතිමය ක්‍රියාවලියකින් පරිභාහිරව, සිදුකර ඇති තවරාජා තේවරාජාගේ ඝාතනය පිලිබඳ ශ්‍රී ලංකාව තුළ පිලියම් සෙවීම නිෂ්ඵලය. තවදුරටත් පැමිණිලිකරු අයියදුරෛ හෝ ඔහුගේ නියෝජිතයන් ශ්‍රී ලංකාවට පය තැබීම ජීවිත අවධානමකි.

97. නීතිමය ක්‍රියාදාමයකින් පරිභාහිරව සිදු කරන ලද තවරාජා තේවරාජාගේ ඝාතනය මගින් 1991 ප්‍රකාශිත, L. 102-256, 106 Stat. 73 (1992 මාර්තු 12) වධ හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත (TVPA) උල්ලංඝනය කර ඇත. මෙම ඝාතනය, පැහැදිලිව හඳුනා ගත හැකි, ආසන්නව ඩොලර් මිලියන පහකට වඩා අධික හානියක් පැමිණිලිකරුට සිදු කර ඇත.

**චෝදනාංකය vi: වධහිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත උල්ලංඝනය කිරීම**

**98 .**ඡේද 1-97 පැමිණිලිකරුවෝ ප්‍රතිචෝදනා කරති.

99. පැමිණිලිකරු ජෙයකුමාර් අයියදුරෛ අදාල නීකිය යටතේ, නීතිමය ක්‍රියාදාමයකින්

පරිබාහිරව සිදු කරන ලද නැසී ගිය, ඔහුගේ ඥාතියෙකු වන කේතිකා තේවරාජාගේ නීත්‍යානුකූල නියෝජිතයාය.

100. කේතිකා තේවරාජා, යුධ කලාපයෙන් පිටත, මොනයම් හෝ නීත්‍යානුකූල යුධමය අරමුණකින් තොරව ශ්‍රී ලංකා යුධ හමුදාව හෝ අනිකුත් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා මගින් ඝාතනය කරන ලද සිවිල් පුරවැසියෙකි. ඇගේ ඝාතනය ජාත්‍යන්තර නීතිය යටතේ හා වධ හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත (TVPA) උල්ලංඝනය කිරීම මගින් යුධ අපරාධයක් බවට පත්වේ.

101. වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකාවේ ජනාධිපති වශයෙන් මෙම පැමිණිල්ලට අදාලව, සැමවිටම, ශ්‍රී ලංකා හමුදාවට හා අනිකුත් සියළුම ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවලට විධාන වගකීම, ඍජුවම හෝ ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් වන තම සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ මගින් හෝ වෙනත් අයුරකින් හෝ අභ්‍යාස කොට ඇත.

102. වගඋත්තරකරු රාජපක්ෂ, ශ්‍රී ලංකා නීතියට පටහැනිව නීතිමය ක්‍රියාදාමයකින් පරිබාහිරව, කේතිකා තේවරාජාගේ ඝාතනය සිදු වන බව හා මෙම කරුන ඉදිරියේ එය යුද අපරාධයක් වන බව දැන සිටියා හෝ දැනගතයුතුව තිබුණා වුවත්, එම අපරාධය වැලැක්වීමට කිසිදු උත්සහයක් දැරුවේ නැත. මෙම කරුණෙන් පසු නීතිමය ක්‍රියාදාමයකින් පරිබාහිරව, සිදු කරන ලද, කේතිකා තේවරාජාගේ ඝාතනය, වගඋත්තරකරු මෙය දැන සිටියා හෝ දැන ගත යුතුව තිබුණා හෝ, වැරදිකරුවන්ට දඩුවම් කිරීමට කිසිත් නොකරන ලදි.

103. වගඋත්තරකරු රාජපක්ෂ එහි අධිකරණ පද්ධතිය දේශපාලනික සම්මුතියකට පත් කර ඇති බැවින් නීතිමය ක්‍රියාදාමයකට පරිබාහිරව කරන ලද කේතිකා තේවරාජාගේ ඝාතනය පිලිබඳ ශ්‍රී ලංකාව තුළ පිලියම් සෙවීම නිෂ්ඵලය. තවද පැමිණිලිකරු අයියදුරෙෙ හෝ ඇගේ නියෝජිතයන් ශ්‍රී ලංකාව පය තැබීම මගින් ජීවිත අවදානමකට ලක් වේ.

104. නීතිමය ක්‍රියාදාමයකින් පරිබාහිරව කරන ලද කේතිකා තේවරාජාගේ ඝාතනය මගින් 1991 ප්‍රකාශිත, L. 102-256, 106 Stat. 73 (1992 මාර්තු 12) වධ හිංසාවට ලක් වූවන් ආරක්ෂා කිරීමේ පණත (TVPA) උල්ලංඝනය කර ඇත. මෙම ඝාතනය, පැහැදිලිව හඳුනා ගත හැකි, ආසන්න වශයෙන් ඩොලර් මිලියන පහකට වඩා අධික හානියක් පැමිණිලිකාරියට සිදු කර ඇත.

**සහනය සඳහා ආයාචනය**

105. පැමිණිලිකරු මනෝහරන් චෝදනාංකය i මත, සාක්ෂි අනුව, වන්දි සහ අධිකරණයට සාධාරණ යුක්ති සහගත බවට හැගෙන වියදම් හා නඩු ගාස්තු ඇතුළුව අනෙකුත් සහන ලබා දෙන තීන්දුවක් ඉල්ලා සිටී.

106. පැමිණිලිකාරිය ලාවාන් චෝදනාංකය ii මත, සාක්ෂි අනුව, වන්දි සහ අධිකරණයට සාධාරණ යුක්ති සහගත බවට හැගෙන වියදම් හා නඩු ගාස්තු ඇතුළුව අනෙකුත් සහන ලබා දෙන තීන්දුවක් ඉල්ලා සිටී.

107. පැමිණිලිකරු අයියදුරෙෙ චෝදනාංකය iii-vi මත, සාක්ෂි අනුව, වන්දි සහ අධිකරණයට සාධාරණ යුක්ති සහගත බවට හැගෙන වියදම් හා නඩු ගාස්තු ඇතුළුව අනෙකුත් සහන ලබා දෙන තීන්දුවක් ඉල්ලා සිටී.

**ජූරියක් සහිත නඩු විභාගයක්**

පැමිණිලකරුවෝ සියළුම චෝදනා සඳහා **ජූරියක් සහිත නඩු විභාගයක්** ඉල්ලා සිටිති.

දිනය: 2011 - 01 - 28

ගෞරවයෙන් ඉදිරිපත් කළේ

......................................

බෲස් ෆෙයින්
කොලොම්බියා දිස්ත්‍රික් අධිකකරණය
නො: 446615
1026, Connectivcut Ave., NW, Ste 1000,
Washington D.C. 20036
Telephone: (703) 963-4968
Facsimile: (202) 478-1660
Email: bruce@thelichfieldgroup.com

පැමිණිලකරුවන් වන කාසිපිල්ලෙ මනෝහරන්, කලෙසෙල්වි ලාවාන්, ජෙයකුමාර් අයියදුරෙ වෙනුවෙන් පෙනී සිටි නීතීඥ.